# 8.3 ව්‍යාපාරවල විවිධ අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පු වර්ග පරීක්ෂා කරයි.

## (අභ්‍යාස)



## අභ්‍යාස : 01

1. ජීවිත රක්ෂණය මගින් රක්ෂිතයෙකුට ලබාගත හැකි ප්‍රධානතම ප්‍රතිලාභ දෙක නම් කරන්න.
..............................................................
..............................................................

2. ගිනි උවදුර නිසා ව්‍යාපාරික කටයුතු අඩාළ වීම වැනි හේතු මත ඇති වන ලාභ නොලැබීයාම් හා වෙනත් වගකීම් ආවරණය සඳහා ලබා ගන්නා රක්ෂණ ඔප්පුව වන්නේ,
..................................................................................

3. නැව් කඳ මුළුමනින් ම විනාශ වීම, මුහුදු බත් වීම , ගිනිබත් වීම හෝ අලුත්වැඩියා කිරීමට නොහැකි තරමට පොඩිපට්ටම් වී තිබීම........................................................ ලෙස සැලකේ .

4. එක ම ද්‍රව්‍ය තොගයක් යම් කාල සීමාවක දී කොටස් වශයෙන් ආනයන හෝ අපනයන කරන්නෙකුට මුළු තොගයේ වටිනාකමට එකවර ලබා ගත හැකි රක්ෂණාවරණය ..................................................... ලෙස හඳුන්වයි.

5. නිරන්තර ආනයන හා අපනයන වෙළෙඳාමේ නියුක්ත ව්‍යාපාරිකයන්ට කිසියම් කාල සීමාවක දී නැව්ගත කිරීමට අපේක්ෂිත භාණ්ඩ තොගය සඳහා පොදුවේ රක්ෂණාවරණය සලසා ගත හැකි සේ නිකුත් කෙරෙන ඔප්පුව . ........................................................... ලෙස හඳුන්වයි.

6. ගුවන් ගමන් වලදී , එමගින් ඇති වන වගකීම්, ගුවන් මගීන් සහ මගීන්ගේ බඩු බාහිරාදිය ආවරණය කෙරෙන රක්ෂණය ..................................................... ලෙස හඳුන්වයි.

7. අදාළ වාහනයට ගින්නෙන් හා සොරකම් කිරීම් වලින් සිදුවන හානි වලට අමතරව බාහිර පුද්ගලයන්ට හා දේපළ වලට සිදුවන හානි ආවරණය වන්නේ ............................................... .

8. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය , සුපරීක්ෂණය හා නියාමනය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනය ................................................................... නම් වේ.

9. දේපළ හෝ ව්‍යාපාර කටයුතුවලින් පැන නැගිය හැකි අහඹු සිද්ධීන් නිසා තුන්වන පාර්ශ්වයකට සිදු විය හැකි හානි වෙනුවෙන් එම දේපළ අයිතිකරු විසින් හෝ ව්‍යාපාරිකයන් විසින් ලබා ගන්නා රක්ෂණාවරණය ..........................
............................................. නම් වේ.

10. තමන් යටතේ සේවය කරන අයට සේවයේ යෙදී සිටිය දී , සේවයේ යෙදීම නිසා ම ඇති වන්නා වූ තුවාල සහ අසනීප වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා සේවායන් විසින් ලබා ගන්නා රක්ෂණය ..............................................................
............................... ලෙස හඳුන්වයි.

## අභ්‍යාස : 02

01.) ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය අතර වෙනස්කම් සඳහන් කරන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය:- ඒ.දයාල් පීරිස් මයා. ගුරුළුගෝමී මහ විදුහල, කළුතර
සැකසුම :- ප්‍රමෝද්‍යා වර්ණකුළ මයා. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
අන්තර්ගතය පරීක්ෂා කිරීම:- ජනක් විජේගුණවර්ධන මයා , රාජකීය විද්‍යාලය , හොරණ

Copyright © www.e-thaksalawa.moe.gov.lk